# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
## MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: 2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: 2513459, 2513498, 2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: 2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019 – 01 - 10

**නීල හරිත ආර්ථිකය යටතේ කාබන් බද්ද ලෙස ඉතා සුළු බද්දක් අය කරනුයේ පාරිසරික අවදානම අඩු කිරීමටය.**

**- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

මෙම වසරේ ජනවාරි මස සිට වාහන සඳහා කාබන් බද්දක් අය කිරීමට රජය තීරණය කර ඇත. නීල හරිත ආර්ථිකය පදනම් කර ගත් රජයේ ආර්ථික වැඩපිළිවෙළ යටතේ පරිසර හිතකාමී පියවරක් ලෙස පාරිසරික අවදානම අඩු කිරීමේ තවත් පියවරක් ලෙස මෙය ක්‍රියාත්මක කෙරේ.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද 2018 අයවැය මගින් යෝජිත පරිදි වාහන හිමිකරුවන්ගෙන් මෙම කාබන් බද්ද ලෙස ඉතා සුළු මුදලක් අය කරනු ලබන අතර පරිසර හිතකාමී තත්ත්වය දිරි ගැන්වීම සඳහා ඉලෙක්ට්‍රොනික වාහනවලින් මෙම බද්ද අය නොකිරීමට ද රජය තීරණය කර ඇත.

ඉලෙක්ට්‍රොනික වාහනවලින් හැර අන් සියලු වාහනවල එන්ජින් ධාරිතාව මත අය කරනු ලබන මෙම කාබන් බද්ද වාහනය ලියාපදිංචි කරන මුල් වසරේ දී අය කරනු නොලැබේ. 2019 ජනවාරි මස සිට ක්‍රියාත්මක මෙම බද්ද වාහනයේ ආදායම් බලපත්‍රය අලුත් කරන අවස්ථාවේ දී අය කරනු ලැබේ.

**ඒ අනුව වර්ගීකරණ තුනක් යටතේ වාහනයක එන්ජින් ධාරිතාව පදනම් කරගෙන එහි එක් ඝන සෙන්ටිමීටරයක් ($cm^3$) සඳහා වාර්ෂිකව මෙම බද්ද පහත පරිදි කරනු ලැබේ.**

| වාහන වර්ගය | වසර 5ට අඩු | වසර 5 -10 අතර | වසර 10ට වැඩි |
|---|---|---|---|
| ඉලෙක්ට්‍රික් | නැත | නැත | නැත |
| දෙමුහුන් | ශත 25 | ශත 50 | 1.00 |
| පෙට්‍රල් සහ ඩීසල් | ශත 50 | 1.00 | 1.50 |

ඒ අනුව උදාහරණයක් ලෙස වසර පහකට අඩු

එන්ජින් ධාරිතාව 125 යතුරු පැදියක් සඳහා (125 x ශත 50) = 62.50

එන්ජින් ධාරිතාව 1000 මෝටර් රථයක් සඳහා (1000 x ශත50) = 500.00

එන්ජින් ධාරිතාව 2600 ජීප් රථයක් සඳහා (2600 x ශත50) = 1300.00

වශයෙන් වාර්ෂිකව ගෙවිය යුතු වේ.

මගී ප්‍රවාහන බස් රථ සඳහා කාබන් බද්ද වාර්ෂික ස්ථාවර ගාස්තුවක් ලෙස
පහත පරිදි අය කරනු ලැබේ.

| වාහන වර්ගය | වසර 5ට අඩු | වසර 5 – 10ත් අතර | වසර 10ට වැඩි |
|---|---|---|---|
| මගී ප්‍රවාහන බස් රථ | 1000/= | 2000/= | 3000/= |

එම්. අලි හසන්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

| Type of vehicle | Less than 5 years | 5 to 10 years | Over 10 years |
|---|---|---|---|
| Hybrid (Petrol/Diesel) | 25 Cts per $cm^3$ | 50 Cts per cm3 | Rs. 1.00 per cm3 |
| Fuel (Petrol/Diesel) | 50 Cts per cm3 | Rs 1.00 per cm3 | Rs 1.50 per cm3 |
| Passenger bus | Rs. 1,000/= | Rs. 2,000/= | Rs. 3,000/= |